**ශීර්ෂය 136 - ක්‍රීඩා අමාත්‍යාංශය**

**----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

ක්‍රීඩා අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**-----------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ක්‍රීඩා අමාත්‍යාංශයේ ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉදිරිපත් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවක් නොතිබුණු බැවින් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අමාත්‍යාංශයේ පොත් අනුව නිලධාරීන්ට ණය ශේෂ එකතුව හා අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය රු. 24,659,853 ක් වූ අතර එය භාණ්ඩාගාර පොත් අනුව රු.24,835,351 ක් වූයෙන් අමාත්‍යාංශය හා භාණ්ඩාගාර පොත් අනුව රු.175,498 ක වෙනසක් නිරීක්ෂණය විය. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතු වීම. | අමාත්‍යාංශයේ පොත් අනුව ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව ශේෂය අතර රු.175,498 ක වෙනසක් පවතී. ඒ අනුව භාණ්ඩාගාරයේ වැඩියෙන් පෙන්වා ඇති රු.175,498 ක් නිවැරදි කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලා අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත 2019.01.02 දින ලිපියක් යොමු කර තිබුණි. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**දේපල පිරියත හා උපකරණ**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2018 ජනවාරි 01 දිනට දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.238,532,264 ක් වූ අතර එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ රු.649,893,382 ක් වූයෙන් රු.411,360,118 ක නොසැසඳු වෙනසක් නිරීක්ෂණය | වෙනසට හේතු හඳුනාගෙන එය නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. | 2017 වර්ෂයේ මිලට ගත් වත්කම් පමණක් 2018 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස භාණ්ඩාගාරයේ ගිණුම්ගත වී තිබුණ අතර 2018 වර්ෂය තුළ ආරම්භක ශේෂ ඇතුළත් කරන ලද වත්කම් නිසා මෙම වෙනස ඇතිවී තිබුණ අතර ඉදිරි |

| | |
|---|---|
| විය. | වර්ෂ වලදී මෙවැනි වෙනසක් ඇති නොවේ. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

**නිරීක්ෂණය**

| නීති රීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 41 වන වගන්තිය | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සඳහා විධිමත් මූල්‍ය ක්‍රියාපටිපාටියක් සහ පරිපාලන රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග පැනවීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ජාතික ඔලිම්පික් කමිටුවේ මූල්‍ය ක්‍රියාකාරිත්වය සඳහා විධිමත් මූල්‍ය ක්‍රියාපටිපාටියක් සහ පරිපාලන රෙගුලාසි සකස් කර ක්‍රියාත්මක කිරීම සඳහා නියෝග පැනවිය යුතු වීම. | ලබා දී ඇති නිර්දේශ අනුව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 2,490.7 ක අග්‍රිම ලබා ගැනීමට සැලසුම් කර රු.මිලියන 2,795.9 ක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණද භාණ්ඩාගාරයෙන් රු.මිලියන 674.4 ක අග්‍රිම පමණක් ලැබී තිබුණි. මේ හේතුවෙන් සැලසුම් කළ පරිදි පාසැල් 1,000 ක්‍රිකට් ක්‍රීඩාව සංවර්ධනය, වාහන හා නඩත්තු වියදම් දැරීම, ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ වෛද්‍ය සැපයීම් කිරීම හා ප්‍රාග්ධන මාරු කිරීම් වැනි කාර්යයන් ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගෙන අදාළ කාර්යන් නිම කළ යුතු වීම. | අග්‍රිම සැලසුම් කර ඉල්ලුම් කළද මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කරන ලද අක්මුදල් ප්‍රමාණය නොලැබීම මෙයට හේතු වේ. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 66 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | පසුගිය වර්ෂයේ දරන ලද වියදම් හා ඉදිරි වර්ෂයට අපේක්ෂිත වියදම් පදනම්ව අයවැය පිළියෙල කිරීම් සිදුකර ඇති අතර හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය, පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | වැය විෂයයන් 7 ක් සඳහා සලසා තිබුණු රු.46,219,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | -එම- | පසුගිය වර්ෂයේ දරන ලද වියදම් හා ඉදිරි වර්ෂයට අපේක්ෂිත වියදම් පදනම්ව අයවැය පිළියෙල කිරීම් සිදුකර ඇති අතර |

| | | | |
|---|---|---|---|
| | | | හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය, පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | වැය විෂයයන් 66 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | පසුගිය වර්ෂයේ දරන ලද වියදම් හා ඉදිරි වර්ෂයට අපේක්ෂිත වියදම් පදනම්ව අයවැය පිළියෙල කිරීම් සිදුකර ඇති අතර හැකි සෑම අවස්ථාවකදීම සාධාරණ පුරෝකථන අනුගමනය කර අයවැය, පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. |

**2.3 තැන්පත් ශේෂයන්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වලට අදාළව එකතුව රු.මිලියන 8.37 ක තැන්පතු 16 ක් වර්ෂ 02 කට වඩා වැඩිකාලයක් මුළුල්ලේ පියවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | තවදුරටත් රඳවා ගැනීමට හේතු නොමැති නම් ගෙවීමට කටයුතු කිරීම හෝ නැතහොත් මාස 06 ක් ඇතුළත රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ශ්‍රී ලාංකිකයින් දිනාගත් ජාත්‍යන්තර ජයග්‍රහන**<br>2017 වර්ෂයේදී ශ්‍රී ලාංකික ක්‍රීඩකයින් ජාත්‍යන්තර තරඟාවලි 08 කට සහභාගි වී රන් 29, රිදී 39 ක් සහ ලෝකඩ 11 ක් වශයෙන් පදක්කම් 79 හිමිකරගෙන තිබුණි. සමාලෝචිත වර්ෂයේදී තරඟාවලි 10 කට සහභාගි වී රන් 23,රිදී 16 ක් සහ ලෝකඩ 22 ක් වශයෙන් පදක්කම් 61 ක් පමණක් ලබාගෙන තිබුණි. | නිසි සැලසුමකට අනුව ජාත්‍යන්තර තරඟ ජයග්‍රහණ සඳහා ක්‍රීඩකයින් පුහුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වීම. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශය විසින් වැල්විටිතුරේ පිහිනුම් තටාකය ඉදිකිරීම, දියගම මහින්ද රාජපක්ෂ ජාතික ක්‍රීඩා ඇකඩමියේ මීටර් 400 කෘත්‍රිම ධාවන පථය, එහි වැසිකිළි පද්ධතියේ හා පිවිසුම් මාර්ග සකස් කිරීම, කුරුණෑගල මලියදේව විද්‍යාලීය වෙඩි තැබීමේ සහ දුනු විදීමේ මධ්‍යස්ථානයක් ඉදි කිරීම යන ව්‍යාපෘති 04 ක් සඳහා රු.මිලියන 429.39 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යාපෘතීන් සඳහා රු.මිලියන 222.48 වැයකර තිබුණි. මෙම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී සහ 2019 මැයි වනවිට නිම කළ යුතු වුවද එම කාල වලදී නිම කර නොතිබුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමාදයන් මඟ හැරීම සඳහා සුදුසු පියවර අනුගමනය කර ඇත. |

| | | |
|---|---|---|
| (ආ) 2016 වර්ෂයේදී රු.මිලියන 108.87 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන යටතේ නුවරඑළිය ක්‍රීඩා නිවහන ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර එය 2017 සැප්තැම්බර් මාසයේදී නිමකළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 30.26 ක් වැයකර තිබුණද එහි කටයුතු නිමකර නොතිබුණි. | නියමිත කාලවකවානු තුළ ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි හා අවශ්‍යතා හඳුනාගෙන සැලැසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුළත ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම. | ප්‍රමාදයන් මඟ හැරීම සඳහා සුදුසු පියවර අනුගමනය කර ඇත. |

## 3.3 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| --------------------- | ---------- | ---------------------------------- |
| අමාත්‍යාංශයේ විදුලි ජනක යන්ත්‍රය හා වායු සමීකරණ පද්ධතියේ 2017 වර්ෂය සඳහා නඩත්තු කිරීමට ආයතන 07 කින් මිල ගණන් කැඳවා තිබුණි. ඉන් එක් ලංසුකරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර නැවත වරක් ලංසු කැඳවීමකින් තොරව එම සැපයුම්කරුට රු.මිලියන 2.52 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. සමාලෝචිත වර්ෂයේ නඩත්තු කටයුතු සඳහා නැවත මිල ගණන් කැඳවීමකින් තොරව පූර්ව සැපයුම්කරුටම රු.මිලියන 2.77 කට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | සේවයේ සතුටුදායක නම් පමණක් හා ආර්ථික වශයෙන් එලදායි නම් දීර්ඝ කිරීම අනුමත කරන බව ලේකම් දන්වා ඇත. මේ සඳහා 2018 වර්ෂයට අදාළව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමක් සිදු නොවුණි. මෙහිදී ආර්ථික වශයෙන් අවාසියක් සිදු වී නොමැත. |

**3.4 වත්කම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**<br>අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් වර්ෂ 03 ක කාලයක සිට නිෂ්ක්‍රියව හා ඌන උපයෝජනව පැවතිණි. | 1997 සැප්තැම්බර් 30 දිනැති අංක 353, 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 හා 2003 ජනවාරි 03 දිනැති අංක 353 (5) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ සහ මුදල් රෙගුලාසි 771 ප්‍රකාරව නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | මෙම රථය ධාවනයෙන් ඉවත් කරන ලෙසට අපහරණ කමිටුව තීරණය කරන ලදී. එම රථය පාසල් සිසුන්ගේ ප්‍රයෝජනයට යොදා ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත. |
| (ආ) **බාහිර පාර්ශ්වයන් වෙත දී ඇති වත්කම්**<br>අමාත්‍යාංශයට අයත් මෝටර් රථයක් සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය වෙත හා ටොයෝටා ජීප් රථයක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මුදාහැර තිබුණි. | අමාත්‍යාංශයේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා ලබා දී ඇති වත්කම් වෙනත් ආයතනවලට පැවැරීමේ දී ඇති අමාත්‍යාංශයේ අරමුණු ඉටු කිරීමට බාධාවක් නොවීමට හා එම වත්කම් විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වීම. | සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ සභාපතිගේ ඉල්ලීම පරිදි 2019.09.28 දින දක්වා පමණක් රථය රාජකාරි සඳහා වෙන් කර දී ඇත.<br><br>ජීප් රථය මෙම අමාත්‍යාංශයට භාර දීමට කටයුතු කරන ලෙස 2018.12.18 දින ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**<br>**---------------------------------** | | |
| | 2018 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 752 (4) සහ 770 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයන්ට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී ඇති කරුණුවලට අනුව අතිරික්ත හා ඌනතා සම්බන්ධයෙන් මු.රෙ.752(4) ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | **වත්කම් ලේඛනගත කිරීම**<br>**---------------------------** | | |
| | අමාත්‍යාංශය සතු රු.12,129,876 ක් වූ විදුලි ජනක යන්ත්‍රය වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 751 ප්‍රකාර සියළු වත්කම් ලේඛන ගත කළ යුතු වීම. | **CIGAS** පද්ධතියට ස්ථාවර වත්කම් ආරම්භක ශේෂ ලෙස ඇතුළත් කිරීමට 2018 වර්ෂයේදී ආරම්භ කළ අතර මෙම වත්කම් මෙම වසරේදී ආරම්භක ශේෂ ලෙස වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.5 කළමනාකරණ දූර්වලතා**
**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය**<br>**----------------------** | **නිර්දේශය**<br>**-----------** | **ප්‍රධාන ගණන් දිමේ නිලධාරීගේ අදහස් දැක්වීම**<br>**---------------------------------** |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟගිටි ශේෂවල එකතුව රු.250,764 ක් වූ අතර එම හිඟගිටි ණය ශේෂ වර්ෂ 02 සිට වර්ෂ 05 ක කාල පරාසයක් මුළුල්ලේ සිට පැවත එමින් තිබුණද ඒවා අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි. | විශ්‍රාම යාම, මිය යෑම හෝ සේවය අවසන් කරන නිලධාරියෙකු සහ රාජ්‍ය සංස්ථාවකට මුදා හරිනු ලබන නිලධාරීයෙකුගේ ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. | අනිවාර්ය විශ්‍රාම ගැනීමෙන් පසු රු.116,015 ක් එක් නිලධාරීයකුගෙන් අයකර ගැනීමට කටයුතු කරන ලද අතර තවත් නිලධාරියෙකුගෙන් රු.134,751 ක් අයකර ගැනීම සඳහා නීතිපති මගින් කටයුතු කරමින් පවතී. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" පිළිබඳව ක්‍රීඩා අමාත්‍යාංශය දැනුවත් වී තිබුණද, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිකුත් කළ අභ්‍යන්තර චක්‍රලේඛ හෝ මහපෙන්වීම් කිසිවක් නොතිබුණි. | අමාත්‍යාංශය විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වීම සම්බන්ධයෙන් මනා සැලසුම් සකස් කිරීම තුළින් ඒ සඳහා සූදානම් වීම කළ යුතු වීම. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මත කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් වැඩමුළු සංවිධානය කොට අවශ්‍ය මඟ පෙන්වීම සිදුකර ඇත. තිරසර සංවර්ධන වැඩසටහන සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය යොදවා ඇති අතර මෙය පුළුල් විෂය පථයක පැතිර පවතින බැවින් කාර්ය මණ්ඩල පුහුණු කිරීම පිළිබඳ ඉදිරියේදී අවශ්‍ය සැලසුම් සිදු කරනු ලැබේ. |

**5. යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන වැඩසටහන්හි ඇතුළත්ව තිබුණු ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීමේ කාර්ය ඉටුකර නොතිබුණි. | මු.රෙ. 134 (2) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කළ යුතු අතර එහි කාර්ය භාරයන් ඉටුකළ යුතුය. | අභ්‍යන්තර විගණන ක්‍රමවේදයක් මනාව කළමනාකරණය කිරීමට නිලධාරීන් යොමු කරවීමට කටයුතු කරනු ලැබේ. |